**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

**பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு**

**Ministry of Public Administration, Provincial Councils and Local Government**

**නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව   சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை.   Independence Square, Colombo 07, Sri Lanka**

| | | | |
|---|---|---|---|
| දුරකථන / தொலைபேசி / Telephone | 011-2696211-13<br>011-2166000 | ෆැක්ස් / தொலைநகல் / Fax | 011-2695279 |
| ඊ-මේල් / மின்னஞ்ச / E-mail | info@pubad.gov.lk | වෙබ් අඩවිය / இணையத்தளம் / Telephone | www.pubad.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No | PA/PSRD/08/10 | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2026.03.11 |

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම්වරුන්

**<u>ජාතික සුපිළිපන් සතිය 2026</u>**

ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් 2026 මාර්තු මස 27 වන දින සිට මාර්තු මස 31 වන දින දක්වා "ජාතික සුපිළිපන් සතිය" ලෙස ලෙස ප්‍රකාශයට පත්කොට ඇත. යෝජිත වැඩසටහන් මාලාව මඟින් මාර්තු මස 31 වන අඟහරුවාදා දින රාජ්‍ය සේවය තුල සුපිළිපන්භාවය ප්‍රවර්ධන කිරීමේ දිනය ලෙස නම්කර ඇත. (ඇමුණුම 01)

02. ඒ අනුව, එම දිනයට අදාළව 2025.09.01 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2008/(II) (ඇමුණුම 02) අනුව යාවත්කාලීන කරන ලද පුරවැසි ප්‍රඥප්තිය විධිමත්ව ප්‍රදර්ශනය සහ සුපිළිපන්භාවය පිළිබඳ පණිවිඩ ප්‍රදර්ශනය කිරීම සඳහා කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

03. මේ සම්බන්ධයෙන් ඔබ විසින් දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන අංකය - 0112698464
ෆැක්ස් අංකය - 0112698461
විද්‍යුත් ලිපිනය - hrdpubadgovlk@gmail.com

පිටපත්

1.ජනාධිපති ලේකම් - ජනාධිපති ලේකම් කාර්යාලය - කරු.දැ.ගැ.ස.

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Provincial Councils and Local Government

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව  சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை.  Independence Square, Colombo 07, Sri Lanka

දුරකථන / தொலைபேசி / Telephone: 011-2696211-13, 011-2166000
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2695279
ඊ-මේල් / மின்னஞ்ச / E-mail: info@pubad.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Telephone: www.pubad.gov.lk

මගේ අංකය / எனது இல / My No: PA/PSRD/08/10
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2026.03.11

அனைத்து அமைச்சின் செயலாளர்கள்
மாகாண சபை பிரதம செயலாளர்கள்
மாவட்ட செயலாளர்கள்

## தேசிய நல்லிணக்க வாரம் 2026

சனாதிபதி செயலகத்தின் மூலம் 2026 மார்ச் மாதம் 27 ஆம் திகதி முதல் மார்ச் மாதம் 31 ஆம் திகதி வரை "தேசிய நல்லிணக்க வாரம்" என பிரகடனப்படுத்தப்பட்டுள்ளது. முன்மொழியப்பட்ட நிகழ்ச்சித்திட்டத்தின் பிரகாரம், மார்ச் 31 ஆம் திகதி செவ்வாய்க்கிழமை தினம் அரச சேவைக்குள் நல்லிணக்கத்தினை ஊக்குவிக்கும் தினமாக பெயரிடப்பட்டுள்ளது (இணைப்பு 01).

02. அதன் பிரகாரம், அத்தினத்திற்குப் உரியதான 2025.09.01 ஆம் திகதிய அரசாங்க நிர்வாக சுற்றறிக்கை இலக்கம் 05/2008(11) (இணைப்பு 02) இன் பிரகாரம், இற்றைப்படுத்தப்பட்ட பிரஜைகள் பிரகடனத்தை முறையாகக் காட்சிப்படுத்தல் மற்றும், நல்லிணக்கம் தொடர்பான செய்திகளைக் காட்சிப்படுத்துவதற்கு நடவடிக்கை எடுக்குமாறு தயவுடன் கேட்டுக்கொள்கின்றேன்.

03. இது தொடர்பாக தங்களால் காட்டப்படும் ஒத்துழைப்பினை மிகவும் பெறுமதியொன்றாக கருதுகின்றேன்.

ஒப்பம்./ எஸ்.ஆலோகபண்டார
செயலாளர்
பொது நிர்வாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு

தொலைபேசி இலக்கம் - 0112698464
தொலைநகல் - 0112698461
மின்னஞ்சல் முகவரி - hrdpubadgovlk@gmail.com

பிரதிகள்
1. சனாதிபதி செயலாளர் - சனாதிபதி செயலகம் - தயவான தகவலுக்காக

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Provincial Councils and Local Government

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව  சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை.  Independence Square, Colombo 07, Sri Lanka

දුරකථන / தொலைபேசி / Telephone – 011-2696211-13, 011-2166000
ෆැක්ස් / தொலைநகல் / Fax – 011-2695279
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail – info@pubad.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Telephone – www.pubad.gov.lk

මගේ අංකය / எனது இல / My No – PA/PSRD/08/10
ඔබේ අංකය / உமது இல / Your No –
දිනය / திகதி / Date – 11.03.2026

All Secretaries of Ministries
Chief Secretaries of Provinces
District Secretaries

## **National Integrity Week 2026**

The Presidential Secretariat has declared the period from 27th of March 2026 to 31st of March 2026 as the "National Integrity Week." Tuesday, March 31 has been designated as the day for promoting integrity within the public service under the proposed series of programs. (Annex 01)

02. You are kindly requested to take necessary action to properly display the Citizen's Charter, updated as per Public Administration Circular No. 05/2008(II) dated 01.09.2025 (Annex 02) and to display messages on integrity to mark the said day.

03. Your cooperation in this matter is highly appreciated.

Sgd/ S. Alokabandara
Secretary Ministry of Public Administration, Provincial Councils and Local Government

Telephone No - 0112698464
Fax No - 0112698461
E-mail - hrdpubadgovlk@gmail.com

Copies:

1. Secretary to the President, Presidential Secretariat – F.Y.I.

# <u>ජාතික සුපිළිපන් සතිය 2026 - යෝජිත වැඩසටහන් විස්තරය</u>

1. කාල රාමුව - 2026 මාර්තු 27 (සිකුරාදා) සිට මාර්තු 31 (අඟහරුවාදා) දක්වා.

2. දැක්ම (Vision) - "සුපිළිපන් සංස්කෘතියක් - ක්ලීන් ශ්‍රී ලංකාවක්"

3. මෙහෙවර (Mission)

ශ්‍රී ලංකාවේ රාජ්‍ය, පෞද්ගලික සහ සිවිල් සමාජය තුළ ජීවත්වන සියළු ප්‍රජාව නීතියට ගරු කරන, ආචාරධර්මීය වගකීම් ඉටුකරන, වගවීම සහ විශ්වාසය ඔවුනොවුන් අතර ප්‍රවර්ධනය කරමින් විනිවිදභාවයෙන් කටයුතු කරන, සමාජීය, පාරසරික හා විශේෂයෙන්ම ආචාරධර්මීය වශයෙන් යහපත් ආකල්ප ගොඩනගාගත් පිරිසක් බවට පත් කිරීම.

4. ප්‍රධාන අරමුණු (Main Objectives)

I. සුපිළිපන්නභාවය ජාතික සංස්කෘතියක් ලෙස සමාජගත කිරීම.
II. විනිවිදභාවයෙන් යුතු පද්ධති හා ක්‍රමවේද හඳුන්වාදීම ප්‍රවර්ධනය කිරීම මගින් සුපිළිපන් රාජ්‍ය සේවාවක් තහවුරු කිරීම.
III. ආර්ථික දියුණුව උදෙසා සාධාරණ වෙළෙඳපොළ සංස්කෘතියක් සහ රාජ්‍ය බදු ගෙවීමේ සුපිළිපන්නභාවය ප්‍රවර්ධනය කිරීම.
IV. අධ්‍යාපනය සහ තරුණ නායකත්වය ඔස්සේ අනාගත සුපිළිපන් පුරවැසියා බල ගැන්වීම.
V. වගකීම් සහගත සදාචාර සම්පන්න සුපිළිපන් මාධ්‍ය සංස්කෘතියක් නිර්මාණය කිරීම.

5. සතිය පුරා ක්‍රියාත්මක වන වැඩසටහන් මාලාවේ විස්තරාත්මක සැලැස්ම

| දිනය | දිනයට අදාළ ක්ෂේත්‍රය |
|---|---|
| මාර්තු 27 (සිකුරාදා) | මාධ්‍ය හා තාක්ෂණය තුළ සුපිළිපන්භාවය ප්‍රවර්ධනය කිරීමේ දිනය |
| මාර්තු 28 (සෙනසුරාදා) | තරුණ හා වැඩිහිටි සහභාගීත්වයෙන් සුපිළිපන්භාවය ප්‍රවර්ධනය කිරීමේ දිනය |
| මාර්තු 29 (ඉරිදා) | ආර්ථික හා ව්‍යාපාරික ක්ෂේත්‍රයේ සුපිළිපන්භාවය ප්‍රවර්ධනය කිරීමේ දිනය |
| මාර්තු 30 (සඳුදා) | අධ්‍යාපනය ක්ෂේත්‍රය තුළ සුපිළිපන්භාවය ප්‍රවර්ධනය කිරීමේ දිනය |
| මාර්තු 31 (අඟහරුවාදා) | රාජ්‍ය සේවය තුළ සුපිළිපන්භාවය ප්‍රවර්ධනය කිරීමේ දිනය |

## 1 වන දිනය - මාර්තු 27 (සිකුරාදා):

### මාධ්‍ය හා තාක්ෂණය තුළ සුපිළිපන්භාවය ප්‍රවර්ධනය කිරීමේ දිනය

සුපිළිපන් සංස්කෘතියක් ගොඩනැගීමට අත්‍යාවශ්‍ය වන විශ්වාසය සහ විනිවිදභාවය මෙම දිනයේදී තහවුරු කරමින්, සත්‍ය තොරතුරු සහ වගකීම් සහගත ආචාරධාර්මික වාර්තාකරණයක් සහිත මාධ්‍ය සහ තාක්ෂණ අංශයේ සුපිළිපන් සංස්කෘතියක් ගොඩනැගීම සඳහා ආරම්භක වැඩපියවරයන් සිදු කිරීම මෙම දිනයේ අරමුණ වේ.

| | | |
|---|---|---|
| වැඩසටහන | ප්‍රධාන වගකීම සහ තොරතුරු වාර්තා කළයුතු අමාත්‍යාංශය/ආයතනය | සාකච්ඡාවට පැමිණීමට පෙර වාර්තා කළයුතු තොරතුරු |
| 1."සුපිළිපන් රටක් -ක්ලීන් ශ්‍රී ලංකාවක්" මැයෙන් පළාත් මට්ටමින් සුපිළිපන් පාගමන 9ක් සංවිධානය | ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | පාගමන සංවිධානය පිළිබඳ පළාත් මට්ටමින් ලබාදීමට යෝජිත කෙටුම්පත් උපදෙස් මාලාව පළාත් මට්ටමින් අදාළ පාගමන් සංවිධානය සඳහා අපේක්ෂිත වියදම් ඇතුළත් ඇස්තමේන්තු වාර්තාව |
| 2. ප්‍රධාන පාගමන (බස්නාහිර පළාත කේන්ද්‍ර කර ගනිමින්) - නිදහස් චතුරශ්‍ර පරිශ්‍රය අවට | සභාපති, ජාතික රූපවාහිනී සංස්ථාව | ප්‍රධාන පාගමන Live විකාශනයට අදාළ මාධ්‍ය සැලැස්ම |
| 3. පළාත් මට්ටමින් සුපිළිපන් පාගමන් අවසානයේ "සුපිළිපන් සංස්කෘතියක් - ක්ලීන් ශ්‍රී ලංකාවක්" ප්‍රස්තුත කරගත් වීදි නාට්‍යක් රඟ දැක්වීම | ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | පළාත් 9හි සංස්කෘතික අමාත්‍යාංශ වෙත මෙම වගකීම් පැවරීමට අදාළ කෙටුම්පත් උපදෙස් මාලාව සහ පළාත් සංස්කෘතික අමාත්‍යාංශ 9හි ලේකම්වරුන්ගේ දුරකථන අංක ඇතුළත් වාර්තාව |
| 4."සුපිළිපන් මාධ්‍යයක් - ක්ලීන් ශ්‍රී ලංකාවක්" උදෙසා ශ්‍රී ලංකා දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්මේ (අධ්‍යාපන හා ප්‍රජා සහභාගිත්වය ක්ෂේත්‍රයේ උප අරමුණු 4.3) සඳහන් පරිදි සියළුම පුවත්පත්, රූපවාහිනී නාලිකා සහ සැබැදි වේදිකා ඇතුළු ප්‍රධාන මාධ්‍ය හවුල්කරුවන් සමඟ දූෂණ විරෝධී මූලපිරීම පිළිබඳ සහයෝගිතා විධිමත් කිරීමේ වැඩසටහන සඳහා අවබෝධතා ගිවිසුම්(MOUs) අත්සන් කිරීම | ලේකම්, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | මේ සම්බන්ධයෙන් දැනට අමාත්‍යාංශය විසින් සිදුකර ඇති කාර්යයන් හා ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු සහ ඉදිරි කෙටුම්පත් වැඩ සැලැස්ම |
| 5. සුපිළිපන් මාධ්‍යකරණය හා ජාතික සුපිළිපන් සතිය පිළිබඳ විද්‍යුත් මාධ්‍ය සාකච්ඡා සංවිධානය කිරීම | ලේකම්, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය<br><br>රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | මාර්තු මාසයට අදාළව සියලුම රූපවාහිනී ආයතන සම්බන්ධ කරගනිමින් මෙම කාර්යය සංවිධානය කිරීමට අදාළ වගකීම පැවරිය හැකි අමාත්‍යාංශ නිලධාරියෙකුගේ තොරතුරු සහ අදාළ වැඩ සැලැස්ම |
| 6. මුතුහර ළමා සමාජ මාධ්‍ය වැඩමුළුව | ලේකම්, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය<br><br>සභාපති, ජාතික රූපවාහිනී සංස්ථාව | කෙටුම්පත් ව්‍යාපෘති වාර්තාව සහ වියදම් ඇස්තමේන්තුව |
| 7. මහජනතාවට ප්‍රවේශ විය හැකි, මාර්ගගත (online) අයිතිකරුවන්ගේ ලේඛනයක් නිර්මාණය කිරීමේ ජාතික වැඩසටහනේ සමාරම්භය (Beneficial Ownership Register) - ජනාධිපති කාර්යාලයේදී | වෙළෙඳ, වානිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපාකාර සංවර්ධන අමාත්‍යාංශය<br><br>සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | මෙම ව්‍යාපෘතිය එළිදැක්වීම සම්බන්ධයෙන් වන කෙටුම්පත් වැඩසටහන් සැලැස්ම |

**2 වන දිනය - මාර්තු 28 (සෙනසුරාදා):**

තරුණ හා වැඩිහිටි සහභාගීත්වයෙන් සුපිළිපන්භාවය ප්‍රවර්ධනය කිරීමේ දිනය

සුපිළිපන් සංස්කෘතියක මූලික පදනම වන ආකල්පමය සහ චර්යාත්මක පරිවර්තනය හා තරුණ හා වැඩිහිටි ප්‍රජාවේ වගකීම ප්‍රවර්ධනය කිරීම මෙම දිනයේ අරමුණයි. අවංකකම, විනය සහ ස්වයං විනිශ්චය අගයන පොදු සමාජ සම්ප්‍රදායක් ගොඩනැගීම සඳහා, තරුණ හා වැඩිහිටි පරම්පරා දෙකේම සාමූහික මැදිහත්වීම දිරිමත් කරමින් නීතිමය රාමුවෙන් ඔබ්බට ගොස් ස්වේච්ඡාවෙන් ක්‍රියාත්මක වන, සුපිළිපන් සංස්කෘතියක් ජනගත කිරීම මෙදින වැඩසටහන් තුළින් ආරම්භ වේ.

| වැඩසටහන | ප්‍රධාන වගකීම සහ තොරතුරු වාර්තා කලයුතු අමාත්‍යාංශය/ආයතනය | සාකච්ඡාවට පෙර වාර්තා කළ යුතු තොරතුරු |
|---|---|---|
| 1. ස්පීකර් මගින් ගම් මට්ටමින් ප්‍රචාරක කටයුතු සිදුකිරීම - සියළුම පළාත් පාලන ආයතන මට්ටමින් (අභ්‍යන්තර ඒකක, 1954 අංකය හා සුපිළිපන්භාවය පිළිබඳ සහ මහජන වගකීම පිළිබඳ දැනුවත් කිරීම) | ලේකම්, රාජ්‍ය පරිපාලන, පලාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | සියලුම පළාත් පාලන ආයතන වෙත උපදෙස් ලබාදීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් වන කෙටුම්පත |
| 2. විශ්ව විද්‍යාල සිසුන් සම්බන්ධ කර ගනිමින් සුපිළිපන් විවාද තරගයක් පැවැත්වීම | ලේකම්, අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය | තරගාවලිය සංවිධානය කරන ආකාරය පිළිබඳ සැලැස්මේ කෙටුම්පත |
| 3. විශ්ව විද්‍යාල සම්බන්ධ කරගනිමින් "සුපිළිපන් සංස්කෘතියක් සඳහා අනාගත ශ්‍රී ලංකාවක් ගොඩනගමු" මැයෙන් විද්වත් සාකච්ඡා මණ්ඩපයක් සංවිධානය | | සාකච්ඡා මණ්ඩප පැවැත්වෙන දිනයන් සහ ස්ථාන ඇතුලත් වැඩසටහන් සැලැස්මේ කෙටුම්පත. |
| 4. "අපේ ගමේ අවංකම මිනිසා" අදහස් හුවමාරුකිරීමේ වැඩසටහන දූෂණයට එරෙහිව නැගී සිටි හෝ අල්ලස ප්‍රතික්ෂේප කර අවංකව ජීවත් වන ගමේ ගෞරවනීය වැඩිහිටියන් හඳුනාගෙන, ඔවුන්ගේ අත්දැකීම් හුවමාරු කිරීමේ සාකච්ඡා මණ්ඩපයක් සංවිධානය, තරුණ ප්‍රජාව ලවා ඔවුන් ඇගයීමට ලක් කිරීමේ ග්‍රාමීය මට්ටමේ වැඩසටහනක් සංවිධානය කිරීම | ලේකම්, ග්‍රාමීය සංවර්ධනය, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය | ග්‍රාමීය මට්ටමින් පුද්ගලයින් තෝරාගැනීමේ නිර්ණායක සහ වැඩසටහන සංවිධානය කිරීමට අදාළ වැඩසටහන් සැලැස්මේ කෙටුම්පත |
| 5.තරුණ හා ක්‍රීඩා කටයුතු අමාත්‍යාංශය විසින් ජාතික සුපිළිපන් සතියට සමාගාමීව සංවිධානය කල හැකි වැඩසටහන් සහ ක්‍රියාකාරකම්<br><br>උදා - තහනම් උත්තේජක භාවිතය සම්බන්ධයෙන් හඳුනාගන්නා ක්‍රියාකාරකම් සහ තරුණ සේවා සභාව, යොවුන් සේනාංකය ආදී ආයතන හරහා තරුණ ඉලක්ක කරගත් වැඩසටහන, සුපිළිපන් ස්ටිකර්, අත් පත්‍රිකා, පෝස්ටර් ව්‍යාපාරයක් ක්‍රියාත්මක කිරීම. | ලේකම්, තරුණ හා ක්‍රීඩා කටයුතු අමාත්‍යාංශය | මෙම වැඩසටහනට අදාළව හඳුනාගන්නා ව්‍යාපෘති යෝජනා ඇතුලත් වැඩසටහන් සැලැස්මේ කෙටුම්පත |

| | | |
|---|---|---|
| 6.දිවයින පුරා ප්‍රජා විශෝධන සමාජිකයින් සම්බන්ධ කරගනිමින් සුපිළිපන්භාවය වර්ධනය කිරීමට අදාළ සිදුකල හැකි වැඩසටහන් ක්‍රියාකාරකම් සහ සංවිධානය | ලේකම්, අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය | මෙම වැඩසටහනට අදාළව හඳුනාගන්නා ව්‍යාපෘති යෝජනා ඇතුලත් වැඩසටහන් සැලැස්මේ කෙටුම්පත |

3 වන දිනය - මාර්තු 29 (ඉරිදා):

ආර්ථික හා ව්‍යාපාරික ක්ෂේත්‍රයේ සුපිළිපන්භාවය ප්‍රවර්ධනය කිරීමේ දිනය

රටේ තිරසාර ආර්ථික දියුණුවට අත්‍යවශ්‍ය වන සුපිළිපන් ව්‍යාපාරික සංස්කෘතියක් සහ සාධාරණ වෙළෙඳපොළක් තහවුරු කිරීම මෙම දිනයේ ප්‍රමුඛතාවයි. පෞද්ගලික අංශය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ සමුපකාර ක්ෂේත්‍රය තුළ විශ්වාසය සහ අවංක ගනුදෙනු දිරිමත් කිරීමට අවශ්‍ය ජාතික වැඩපිළිවෙලක් සකස් කරමින් සුපිළිපන්භාවය ආර්ථිකයේ ප්‍රධාන නිර්ණායකය බවට පත් කිරීම තුළින්, සියලු පාර්ශ්වයන්ට සාධාරණත්වයෙන් යුක්ත ස්ථිර ආර්ථික පදනමක ආරම්භය සකස් කිරීම මෙම දිනය මගින් සනිටුහන් කෙරේ.

| වැඩසටහන | ක්‍රියාත්මක කිරීම හා වගකීම | සාකච්ඡාවට පෙර වාර්තා කළ යුතු තොරතුරු |
|---|---|---|
| 1."සාධාරණ වෙළෙඳපොළක් - තිරසාර ආර්ථික දියුණුවට මගක්" සුපිළිපන්නභාවය ප්‍රවර්ධනය තුලින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් හා ව්‍යාපාරිකයින් ප්‍රවර්ධන වැඩසටහන - සියළුම ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමින්. | ලේකම්, කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය | ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළ වැඩසටහන් සැලැස්මේ කෙටුම්පත |
| 2.සාධාරණ මිල නියාමනයක් හා ගුණාත්මක භාණ්ඩ හා සේවා සැපයීමක් සඳහා වෙළෙඳපොල හැසිරවීම සම්බන්ධයෙන් සමුපාකාර නියෝජිතයින් දැනුවත් කිරීමේ වැඩසටහන - සියළුම දිස්ත්‍රික් මට්ටමින්. | ලේකම්, වෙළෙඳ, වානිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය | පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු සම්බන්ධ කර ගනිමින් පළාත් හෝ දිස්ත්‍රික් මට්ටමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළ වැඩසටහන් සැලැස්මේ කෙටුම්පත |
| 3."බදු ශක්ති" වැඩසටහන හා ඒකාබද්ධ දැනුවත් කිරීමේ වැඩසටහන සහ පුද්ගලික අංශයේ සමාගම් හා ආයතන සම්බන්ධ කරගනිමින් වැඩමුළු සංවිධානය කිරීම. බදු ගෙවීම පිළිබඳ බදුගෙවන්නන් දිරිමත් කිරීමටත් ඇගයීමටත් අදාල ක්‍රියාකාරකම් | අධ්‍යක්ෂ, ආදායම් පරිපාලන ප්‍රතිසංස්කරණ හා නවීකරණ කාර්යාංශය, ජනාධිපති ලේකම් කාර්යාලය | මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළ වැඩසටහන් සැලැස්මේ කෙටුම්පත |
| 4.දිවයින පුරා පළාත් පාලන ආයතන යටතේ සතිපොළ, මස් මාළු හා අනෙකුත් වෙලෙඳසැල් පරීක්ෂා කිරීම, දෝෂ සහිත උපාංග හඳුනා ගැනීම, ප්‍රමිතියෙන් තොර අලෙවිකරණ අවස්ථා නියාමනය හා නිවැරදි කිරීම, හා පාරිභෝගිකයින් | ලේකම්, වෙළෙඳ, වානිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය<br><br>මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව | මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළ වැඩසටහන් සැලැස්මේ කෙටුම්පත |

| | | |
|---|---|---|
| දැනුවත් කිරීම (මෙදිනට නිතීමය කටයුතුවලින් තොරව දැනුවත්භාවය හා අවංකව ව්‍යාපාරික කටයුතු කිරීම ප්‍රවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ). | | |
| 5.පෞද්ගලික අංශයේ ආයතන හා සමාගම් තුළ සුපිළිපන්නභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩමුළුවක් සංවිධානය | ලේකම්, වෙළෙඳ, වානිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය<br><br>ලේකම්, කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය | අමාත්‍යාංශ 2 ඒකාබද්ධව මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළව එක් එක් අමාත්‍යාංශයේ වැඩසටහන් සැලැස්මේ කෙටුම්පත |
| 6.ඉහත වැඩසටහන් හා ක්‍රියාකාරකම්වලට අමතරව මෙම දිනය ඉරිදා දිනයක් වන බැවින් දිවයිනේ සියළුම දහම් පාසල් ආවරණය වන පරිදි සුපිළිපන්භාවය වර්ධනය කිරීම සඳහා සුදුසු වැඩසටහනක් සංවිධානය කිරීම | ලේකම්, බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය<br>බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්,<br>හින්දු/මුස්ලිම්/ක්‍රිස්තියානි ආගමික කටයුතු අධ්‍යක්ෂ | මෙම වැඩසටහනට අදාළව හඳුනාගත්තා ව්‍යාපෘති යෝජනා ඇතුලත් වැඩසටහන් සැලැස්මේ කෙටුම්පත |

**4 වන දිනය - මාර්තු 30 (සඳුදා):**

**අධ්‍යාපනය ක්ෂේත්‍රය තුළ සුපිළිපන්භාවය ප්‍රවර්ධනය කිරීමේ දිනය**

සුපිළිපන් සංස්කෘතියක ස්ථිර පැවැත්ම සඳහා වන අනාගත පරපුර බලගැන්වීම මෙම දිනයේදී තහවුරු කෙරේ. අධ්‍යාපන පද්ධතිය තුළ, සුපිළිපන්භාවය පිළිබඳ දැනුම සහ අත්දැකීම් සිසුන්ගේ ජීවිතයට සමීප කිරීමට අවශ්‍ය පුළුල් ජාතික යාන්ත්‍රණයක් ස්ථාපිත කෙරේ. සුපිළිපන් සමාජ (Integrity Clubs) වැනි ව්‍යුහයන් හරහා, අනාගත පරපුර සඳහා ශක්තිමත්, සදාචාරාත්මක පදනමක් ගොඩනැගීමට ආරම්භයක් මෙම දිනයේ වැඩසටහන් තුළින් අපේක්ෂා කෙරේ.

| වැඩසටහන | ක්‍රියාත්මක කිරීම හා වගකීම | සාකච්ඡාවට පෙර වාර්තා කළ යුතු තොරතුරු |
|---|---|---|
| 1.2026 වර්ෂයේදී පවත්වනු ලබන "සුපිළිපන් පාසල් නිර්මාණ තරගාවලිය - 2026" හඳුන්වාදීම (කවි, කෙටිකතා, රචනා, කෙටි වීඩියෝ) | ලේකම්, අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>(අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ සහය ඇතිව) | මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළ වැඩසටහන් සැලැස්මේ කෙටුම්පත |
| 2.සිසුන් අතර සුපිළිපන්බව සංස්කෘතියක් ලෙස පෝෂණය කිරීම සඳහා සියළු පාසල්වල සුපිළිපන් සමාජ 2026.03.30 වන දින ස්ථාපිත කිරීම සහ මාර්ගෝපදේශ ඇතුලත් චක්‍රලේඛයක් නිකුත් කිරීම. | | පාසල් තුළ මෙම සමාජ පිහිටුවීම සඳහා නිකුත් කිරීමට නියමිත චක්‍රලේඛයේ කෙටුම්පත<br><br>මෙම සුපිළිපන් සමාජවල ව්‍යුහය සහ ඒවායින් අපේක්ෂිත කාර්යභාරය, ක්‍රියාත්මක කිරීමට ඇතුලත් මාර්ගෝපදේශ පිළිබඳ විස්තරයක්. |

| | | |
|---|---|---|
| 3.සියළුම පාසල්වල නිර්මාණය කරනු ලබන සුපිළිපන් සමාජ හරහා පාසල් සිසුන්, සුපිළිපන් ගුණාංග පිළිබඳ දැනුවත් කිරීමේ විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. | | සියලුම පාසල් එකවර ආවරණය වන පරිදි වැඩසටහන ක්‍රියාත්මක කරන ආකාරය. |
| 4.දිස්ත්‍රික් මට්ටමින් වෘත්තිය අධ්‍යාපන ක්ෂේත්‍රය යටතේ ගුරුවරුන් හා සිසුන් සුපිළිපන්භාවය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් 25ක් සංවිධානය. | | දිස්ත්‍රික් මට්ටමින් වැඩසටහන් පවත්වන ස්ථාන ලැයිස්තුව සහ මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළ වැඩසටහන් සැලැස්මේ කෙටුම්පත |

**5 වන දිනය - මාර්තු 31 (අඟහරුවාදා):**

රාජ්‍ය සේවය තුළ සුපිළිපන්භාවය ප්‍රවර්ධනය කිරීමේ දිනය

ජාතික සුපිළිපන් සතියේ අවසන් දිනය වන මෙය, රාජ්‍ය සේවයේ වගවීම සහ විනිවිදභාවය ආයතනගත කිරීම හරහා මහජන විශ්වාසය තහවුරු කරන, තොරතුරු තාක්ෂණයෙන් සහ සක්‍රිය අභ්‍යන්තර යාන්ත්‍රණයන්ගෙන් සමන්විත සුපිළිපන් රාජ්‍ය සේවයක් බිහි කිරීම තුළින් අල්ලස, දූෂණය, වංචාව පිටු දකිමින් කාර්යක්ෂම රාජ්‍ය සේවයක් තිරසාරව පවත්වා ගැනීමේ ස්ථිර ආරම්භය මෙම දිනය මඟින් සනිටුහන් කෙරේ.

| වැඩසටහන | ක්‍රියාත්මක කිරීම හා වගකීම | සාකච්ඡාවට පෙර වාර්තා කළ යුතු තොරතුරු |
|---|---|---|
| 1. විනිවිදභාවය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින්, ජාතික විද්‍යුත් ප්‍රසම්පාදන අධීක්ෂණ පද්ධතිය හඳුන්වාදීමේ සමාරම්භය හා ප්‍රාදේශිය මට්ටමින් ක්ලීන් ශ්‍රී ලංකා සම්බන්ධීකාරකවරුන් සමග එක්ව සිදු කරනු ලබන සමීක්ෂණය | මුදල්, ක්‍රමසම්පාදන, ආර්ථික කටයුතු අමාත්‍යාංශය | මෙම කාර්යය ක්‍රියාත්මක කිරීමට අදාළ වත්මන් ප්‍රගතිය<br><br>ප්‍රාදේශීය මට්ටමින් සිදුකරන සමීක්ෂණය සඳහා වන ප්‍රශ්නාවලිය කෙටුම්පත. |
| 2.පුරවැසි ප්‍රඥප්තිය විධිමත්ව ප්‍රදර්ශනය සහ රාජ්‍ය ආයතන වල සුපලිපන්නභාවය පිළිබඳ පණිවිඩ ප්‍රදර්ශනය කිරීම | ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | සෑම ආයතනයකම ප්‍රදර්ශනය කළ යුතු ප්‍රඥප්තියේ සම්මත ආකෘතිය |
| 3. සුපිළිපන්නභාවය සහ වගකීම ප්‍රවර්ධනය කිරීම සඳහා අධිකරණය විසින්ම සකස් කරන ලද, අධිකරණය සඳහා පැහැදිලි චර්යා මාර්ගෝපදේශ නිර්මාණය කිරීම හඳුන්වා දීම | අධිකරණ, හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය<br><br>අධිකරණ සේවා කොමිෂන් සභාව | මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළ වැඩසටහන් සැලැස්මේ කෙටුම්පත |
| 4. නීතිපති දෙපාර්තමේන්තුව යටතේ නිතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සඳහා ආචාර ධර්ම සංග්‍රහයක් හඳුන්වා දීම. | නිතිපති දෙපාර්තමේන්තුව | මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළ වැඩසටහන් සැලැස්මේ කෙටුම්පත |
| 5. පොලිස් බලකාය තුළ දූෂණය අඩු කිරීම සඳහා විශේෂ දූෂණ විරෝධී පුහුණුවක් ක්‍රියාත්මක කිරීමේ වැඩසටහනේ සමාරම්භය | ශ්‍රී ලංකා පොලීසිය | මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළ වැඩසටහන් සැලැස්මේ කෙටුම්පත |

ඇමුණුම 02

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 05/2008 (II)

මගේ අංකය: PA/PSRD/08/10
රාජ්‍ය පරිපාලන, පළාත්සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2025.09. 01

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා සභාපතිවරුන් හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**<u>පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වාදීම.</u>**

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2008.02.06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2008 සහ 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2008(I) කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. "රාජ්‍ය ආයතන වල අභ්‍යන්තර කටයුතු ඒකක පිහිටුවීම" යන මැයෙන් ජනාධිපති ලේකම් විසින් නිකුත් කරන ලද අංක PS/SB/Circular/ 2/2025 හා 2025.02.18 දිනැති චක්‍රලේඛයේ 4.0 (viii) වගන්තිය කෙරෙහි ද අවධානය යොමු කරවමි. ඒ අනුව, රාජ්‍ය ආයතනවල පිහිටුවන ලද අභ්‍යන්තර කටයුතු ඒකක විසින් 'ආයතන විසින් සපයනු ලබන සේවාවන් සංක්ෂිප්ත වශයෙන් දක්වන පුරවැසි ප්‍රඥප්තියක් සකස් කර ප්‍රකාශයට පත් කිරීම' සිදු කළ යුතු බව සඳහන් කර ඇති, "ශ්‍රී ලංකා දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2025 - 2029" හිද පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සකස් කර ප්‍රකාශයට පත් කිරීම එක් ක්‍රියාකාරකමක් ලෙස හඳුනාගෙන ඇත.

03. ඒ අනුව, රාජ්‍ය ආයතන විසින් මහජනයා වෙත ලබා දෙන සේවාවන් වඩාත් විනිවිදභාවයෙන් යුතුව කාර්යක්ෂමව හා ඵලදායි අයුරින් ලබාදීමට වගබලාගැනීමටත්, ඒ සඳහා සම්බන්ධවන්නා වූ සියලු පාර්ශවයන් අතර මනා අවබෝධය සහ එකිනෙකා අතර විශ්වාසය වැඩි දියුණු කිරීම උදෙසාත්, සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම තම ආයතන සඳහා වන පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය (ඇමුණුම 01 පරිදි) සකස් කර ප්‍රකාශයට පත් කළ යුතුය.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
දුරකතනය : +94 112 196604
විද්‍යුත් ලිපිනය : adsecrefd@pubad.gov.lk

පිටපත් :

01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩල ලේකම්
04. විගණකාධිපති

ඇමුණුම 01

## පුරවැසි ප්‍රඥප්තිය - ( ආයතනයේ නම)

අංශය - ..........................................

| අනු අංකය | සපයනු ලබන සේවාව | අදාළ නීති සංග්‍රහ, රෙගුලාසි | ඉදිරිපත් කළ යුතු ලියවිලි | | | සේවාව සැපයීම සඳහා ගතවන කාලය (මාස/ සති/ දින/ පැය) | වගකිව යුතු නිලධාරියාගේ | | | සේවාව නිසි ආකාරව ඉටු නොවීම පිළිබඳව පැමිණිලි කළ යුතු නිලධාරියා | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ඉදිරිපත් කළ යුතු ආකෘති පත්‍රය | ආකෘති පත්‍ර ලබා ගත හැකි ස්ථානය | අදාළ ගාස්තුවක් වේ නම් ගාස්තුව සහ එය ගෙවිය යුතු ආකාරය | | නම | තනතුර | දුරකතන/ ෆැක්ස්/ විද්‍යුත් තැපැල | නම | තනතුර | දුරකතන/ ෆැක්ස්/ විද්‍යුත් තැපැල |
| 1. | | | | | | | | | | | | |
| 2. | | | | | | | | | | | | |
| 3. | | | | | | | | | | | | |
| 4. | | | | | | | | | | | | |